# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක
'ගමට සන්නිවේදනය ව්‍යාපෘතියේ' ව්‍යාපෘති සම්බන්ධීකාරක තනතුර සඳහා
බඳවා ගැනීම**

**විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන 'ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය' සඳහා ව්‍යාපෘති සම්බන්ධීකාරක තනතුරට සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (මූලිකව වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබේ.)**

**1. බඳවා ගැනීමේ සුදුසුකම් :-**

<u>අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්</u>

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජවේදි, ව්‍යාපාර කළමනාකරණ, සංඛ්‍යානය, නීතිවේදි ,විද්‍යාවේදී ,ආර්ථික විද්‍යා ,ව්‍යාපෘති කළමනාකරණ, මානව සම්පත් කළමනාකරණ හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයකට අදාළ ව ලබාගත් මූලික උපාධියක්

හෝ

ඉහත සඳහන් ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් වූ උපාධියකට සමාන බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

ඉහත සඳහන් ක්ෂේත්‍රයකට අදාළ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් වරලත් සාමාජිකත්වය (ආශ්‍රිත) හෝ සමාන වෘත්තීය සුදුසුකමක්

**2. අපේක්ෂකයන් සතු පහත සඳහන් කුසලතාවයන් හා පළපුරුද්ද කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.**

1. මනා ලෙස භාෂාව හැසිරවීමේ හැකියාව (ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ)
2. විශිෂ්ට සන්නිවේදන කුසලතා
3. සම්බන්ධීකරණ හැකියාව
4. ඉදිරිපත් කිරිමේ හැකියාව
5. ඉතා ඉහළ පරිඝනක සාක්ෂරතාවය
6. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද

**3. වයස් සීමාව :**

ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කල යුතු අවසාන දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.

**4. වැටුප් :**

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 පරිදි මාසිකව රු.55,000/-ගෙවනු ලැබේ.

මීට අමතරව චක්‍රලේඛයේ සඳහන් පරිදි දීමනා ගෙවනු ලැබේ.

**5. සේවා කොන්දේසි :**

වව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර, පත්කිරීම් සිදුකරනු ලබන්නේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලබාගත් ලකුණු පදනම් කරගෙනය.

**6. වෙනත් ප්‍රතිලාභ :**

සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් ගෙවනු ලැබේ.

**අයදුම්කරන ක්‍රමය :-**

අයදුම්පත් www.trc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.11.09 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනටමත් රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරීන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ව්‍යාපෘති තනතුර සඳහා මේ වන විට සේවයේ යෙදී සිටින නිත්‍ය තනතුරින් තාවකාලිකව නිදහස් කිරීමට ආයතන ප්‍රධානියාගේ එකඟතාවය සහිතව එවිය යුතුය. අදාල සහතිකවල පිටපත් ද අමුණා එවිය යුතු අතර එසේ නොඑවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. මෙම සියලුම ලියවිලිවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කල යුතුය.

බඳවාගනු ලබන තනතුරු ප්‍රමාණය හෝ බඳවා ගැනීම කල් දැමීම / අවලංගු කිරීම් පිළිබඳව තීරණ ගැනීම් අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතුය. කොමිෂන් සභාව වෙත ඕනෑම ආකාරයක බලපෑම් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසු කමක් වේ.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**අංක 276**
**ඇල්විටිගල මාවත**
**කොළඹ 08**